# පුරාණ වැවක වාරි තාක්ෂණික අංගෝපාංග හැඩගස්වා ගැනීම සඳහා භූ භෞතික පරිසරය උපයෝගී කරගැනීමේ විශේෂතාව (කුරුණෑගල පඬුවස්නුවර පඬාවැව ඇසුරින්)

**ආර්.ඒ.ඩී.එම්.එන්. රණසිංහ* හා සී.ආර්. විතානාච්චි**

පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයන අංශය,

සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

**senavirathnasameera@gmail.com*

ප්‍රමුඛපද: භූ භෞතික පරිසරය, කොළමුණුඔය, වාරි තාක්ෂණික අංග

## හැඳින්වීම

පුරාණ වැවක වාරි තාක්ෂණික අංගෝපාංග ඉදි කිරීමේ දී ප්‍රදේශයේ පවතින භූ භෞතික පරිසරය විශේෂ තාක්ෂණික ඥානයකින් භාවිත කර ඇති ආකාරය කෙබඳු වේද යන්න පිළිබඳ ව කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුරාණ පඬාවැව ඇසුරින් අධ්‍යයනයක් සිදුකිරීම අපගේ පර්යේෂණය ඔස්සේ සිදුකරනු ලබයි.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ව පුරාණ පඬාවැව පිහිටා ඇත. දැදුරු ඔයේ අතු ගංගාවක් වන කොළමුණුඔය පඬුවස්නුවර ප්‍රදේශයෙන් සම්පූර්ණයෙන් ම හරස් කිරීමෙන් ඉදිකර ඇති මෙම වැව පඬුවස්දෙව් රජතුමාගේ කාලයේ දී ඉදිකරන ලද බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

පුරාවිද්‍යාත්මක වශයෙන් පඬාවැව සම්බන්ධයෙන් තොරතුරු හමුවන්නේ පළ වන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයට සම්බන්ධව ය. මේ වන විට නටඹුන් පමණක් ඉතිරිව තිබෙන වැවක් බවට පත් වී ඇති වැවේ වැව් බැම්ම ආශ්‍රිත ව දකුණු ඉවුරේ ඇති ගොඩ සොරොව්ව, දකුණු ඉවුරේ ඇති මඩ සොරොව්ව සහ වම් ඉවුරේ ඇති ගොඩ සොරොව්ව, පිටවාන හා ගල් පාලමේ ශේෂ වී ඇති කොටස් සහ රළපනාව යන ශේෂ වී පවතින වාරි තාක්ෂණික අංග ඇසුරින් මෙම අධ්‍යයනය සිදුකරනු ලබයි.

පුරාණ වැවක එක් එක් වාරි තාක්ෂණික අංග එම වාරි අංගයෙන් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි පරිදි ස්වභාවික පරිසරයේ වඩාත් උචිත ස්ථානයක පිහිටුවා ඇති ආකාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය විය. පඬාවැව ආශ්‍රිත ව භූ ගෝලීය පසුබිම හා පාරිසරික තත්ත්වය පිළිබඳ ව නිරවුල් අවබෝධයක් ලබා ගැනීම තුළින් පුරාණ වැවක් ඉදිකිරීමට භූමිය තෝරා ගැනීමේ දී අවධානය යොමුකළ

කරුණු හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ තවත් අරමුණක් විය.

### අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණය යන ක්‍රමවේද ද්විත්වය ම භාවිත කරන ලදි. ක්ෂේත්‍රය හඳුනා ගැනීම සඳහා මුලින් ම පඬාවැව ඇතුළත්වන සිතියම් හා ක්ෂේත්‍රයට ඉහළින් ලබාගත් ඡායාරූප ද අධ්‍යයනය කරන ලදි. මහාවංසය ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස අධ්‍යයනය කරන ලදි. අනතුරුව පඬාවැව සම්බන්ධයෙන් අධ්‍යයන සිදුකර ඇති හෙන්රි පාකර්, ආර්. එල්. බ්‍රෝහියර් මෙන් ම මෑත කාලීන ව සිදුකළ අධ්‍යයනය වන විජේරත්න බෝහිංගමුවගේ පඬාවැව සම්බන්ධයෙන් පළ කරන ලද ලිපිත් මූලික වශයෙන් පරිශීලනය කරනු ලැබී ය. මීට අමතර ව ක්ෂේත්‍ර ගවේෂණය ඔස්සේ වැවේ ශේෂ වී පවතින නටඹුන් නිරීක්ෂණය කිරීමත් සම්මුඛ සාකච්ඡා පැවැත්වීමත් සිදුකරන ලදි.

### ප්‍රතිඵල සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්ත ක්ෂේත්‍රය ලංකාවේ භෞතික පරිසරයට ගැළපෙන ආකාරයට රටේ ස්වභාවික සම්පත් වඩාත් අර්ථවත් ව භාවිත කළ අවස්ථාවක් බව පැහැදිළි වේ. ඒ බව දහනව වනසියවසේ නිරීක්ෂණය කරන විටත් ඒ වනවිට පැවති වැව් බැමි අතුරින් බිඳී තිබුණේ සුළු වශයෙන් බව ශ්‍රී ලංකාවේ වාරිකර්මාන්ත සම්බන්ධයෙන් අධ්‍යයනය කළ බ්‍රෝහියර් පෙන්වා දීමෙන් පැහැදිළි වේ (ගමගේ, 2005; පි. 18).

පුරාණ පඬාවැවේ ශේෂ වී ඇති වාරි තාක්ෂණික අංගයන් පුරාණ වැවක් ඉදිකිරීමේ දී ප්‍රදේශයේ පවතින භූ භෞතික පරිසරය මනාශිල්පීය දැනුමකින් භාවිත කරන ලද අවස්ථාවකට උදාහරණයක් වශයෙන් පෙන්වා දිය හැකි ය.

වැව්වල කල්පැවැත්ම පිළිබඳ ව අවධානය යොමුකළ පැරණි ශිල්පීන් වැව් ඉදිකිරීම සඳහා හැකි තරම් දුරට පාෂාණ උද්ගතයන් ප්‍රයෝජනයට ගෙන ඇත. Quartzite ridge, Vertical granite gneiss, Biotite hornblende gneiss, Crystalline rock වැනි පාෂාණ ස්ථර ආශ්‍රිත ව විශාල වැව්වල බැමි ඉදිකිරීමට උත්සාහ ගෙන ඇත. මේ වන විට ගල්ගමුව වැව, මින්නේරිය වැව, කලාවැව, පරාක්‍රම සමුද්‍රය හා තෝරගොල්ල වැනි දැවැන්ත වැව් මෙවැනි පාෂාණ ස්ථර ආශ්‍රිත ව ඉදිකරනු ලැබූ බව ඒ ආශ්‍රිත ව සිදුකර ඇති පර්යේෂණ තුළින් හඳුනාගෙන ඇත (මැන්දිස්, විතානාච්චි, 2011; 107).

පඬාවැවේ කි.මී. 2.6ක් එනම් අඩි 8,400ක් දිග වැව් බැම්මේ වැඩි ප්‍රමාණයක් මෙවැනි උද්ගතයක් ආශ්‍රිත ව තිබෙන ආකාරය නිරක්ෂණය කිරීමට පුළුවන. පිටවාන ආශ්‍රිත ව ද දැකගත හැකි පාෂාණය මෙයට එක් නිදසුනක් වේ.

වැවක අතිරික්ත ජලය පිටකරන පිටවානෙන් ස්වභාවික ව අධික ජල පරිමාවක් ඉවත්වන බැවින් වැවක පිටවාන ශක්තිමත් ව ඉදිකළ යුතු ය. ඒ සඳහා බාදනයට ඔරොත්තු දෙන ග්‍රැනයිට්, නයිස් වැනිපාෂාණ කුට්ටි උපයෝගී කරගෙන තිබේ. මීට අමතර ව වාන ඉදිකිරීම සඳහා ස්වභාවික පාෂාණ ස්ථරය ද භාවිත කර තිබේ. පඬා වැවේ පිටවාන ද ස්වභාවික ගල් තලාවක් ඔස්සේ ඉදිකර ඇත.

වැව් බැම්ම අසල පිහිටි ස්වභාවික ගල්තලාව හරහා පිටවාන ඉදිකිරීමට සුදුසු ආකාරයෙන් වැව් බැම්මේ සෘජු රේඛීය ගමන් මාර්ගය වෙනස්කර තිබේ. කොළමුණු ඔයබඩ පහත්බිම් හරහා උතුරු දකුණු දිශාව ඔස්සේ ඉදිවුණු වැව්බැම්ම ගඟ හරහා සෘජු රේඛීය ආකාරයට ඉදිකර නිම්නයේ දකුණු දිශාවෙන් පිහිටි විශාල ගල් පර්වතයකට සම්බන්ධවන තෙක් නිරිත දිශාව බලා ගමන් කරන ආකාරයට නිර්මාණය කර ඇති බව හඳුනාගත හැකි ය. වැව්බැම්මේ සෘජු රේඛීය ගමන් මාර්ගය වෙනස්කර ඇති අකාරය පඬාවැවේ වැව්බැම්මේ හෙන්රි පාකර් විසින් ඇඳ ඇති සිතියම නිරීක්ෂණය කිරීමේ දී ප්‍රත්‍යක්ෂ වේ.

වැවක් ඉදිකිරීමේ දී වැව්බැම්මේ දිග අඩුකර ගැනීම සඳහා දෙපස පිහිටි ස්වභාවික කඳු හා උස්බැම් ආශ්‍රය කරගැනීම මහවැව් නිර්මාණය කිරීමේ දී සුලභ ව දකගත හැකි ය. එමඟින් වැව්බැම්ම වඩාත් ශක්තිමත් කිරීමටත් බැම්ම ඉදිකිරීමේ දී යෙදවීමට සිදුවන මිනිස් ශ්‍රමය අඩුකිරීමටත් හැකියාව ලැබේ. මේ ආකාරයට පඬාවැවේ පිටවාන ලෙසින් යොදාගෙන ඇති ගල් පර්වතයෙහි බෑවුමෙහි සිට යළිත් දකුණු දිශාව එල්ලේ ඉදිවුණු වැව්බැම්ම කෙටි දුරක් ගිය පසු සෘජුකෝණී ව හැරී, බැම්ම ඉදිකළ දිශාව එක් වරම වෙනස් කිරීමෙන් උස්බිමෙහි ස්වභාවික ආනතිය ප්‍රයෝජනයට ගැනීම නිසා පස් කපා ගොඩගැසීම සඳහා වැයකළ යුතු ව තිබූ විශාල ශ්‍රම සම්භාරයක් ඉතිරිකරගත හැකි වී ඇති බව පැහැදිළි ය (පෙරේරා, 2008; පි.441).

වැවේ පිටවාන අසල ගල් පාලම ඉදිකිරීමේ දීත් වාන හරහා කාණුවක් කපා ඉදිකර තිබෙන බැම්ම ඉදිකිරීමේදීත් එම ස්වභාවික පාෂාණ උද්ගතයේ පිහිටීම උපයෝගී කරගෙන ඇත.

විශාල වැව්වල ගබඩාකරගත් ජලය ඊට පහළින් පිහිටි කුඹුරු වලට ඇළමාර්ග ඔස්සේ මනා කාර්යක්ෂමතාවකින් යුතු ව ඉහළ කළමනාකරණයකින් භාවිත කිරීමට පැරැන්නෝ සමත් වී ඇත. පරාක්‍රමබාහු රජතුමා විසින් වැව් බැම්ම කොළමුණුඔය හරහා උතුරු දෙසට දීර්ඝකර තිබේ. වැව්බැම්මේ පහළට දකුණු දෙසට වන්නට පවතින උස්බිම් ස්වභාවය නිසා කෘෂිකර්මාන්තයට යෝග්‍ය නොවේ. නමුත් වැවේ බැම්මේ උතුරු දෙසට වන්නට පවතින තැනිතලා භූමිය වගාකටයුතු සඳහා යෝග්‍ය වේ. වැව විශාලකිරීමෙන් වැවේ ජලයෙන් දුදුරු ඔයට දකුණින් ඇති කුඹුරු අස්වද්දන්නට ඇත. පඬාවැවේ ඇළ

මාර්ග හා කෙත්වතු ගොඩ නැගීමේ දී භූමියේ ස්වභාවය මනාව ප්‍රයෝජනයට ගෙන ඇති ආකාරය නිරීක්ෂණය කිරීමට පුළුවන.

ප්‍රදේශයේ පවතින භූ භෞතික පරිසරයේ ස්වභාවය මනාව හඳුනාගනිමින් වැවේ ආරක්ෂාව, වාරි ජලයෙන් වැඩි කුඹුරු ප්‍රමාණයක් අස්වැද්දීම වැනි අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා භූමිය මනාශිල්පීය දැනුමකින් හසුරුවා ඇති අකාරය පුරාණ පඬාවැවේ වාරි නිර්මිතයන් තුළින් විද්‍යමාන කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


පරි. පෙරේරා, එන්. (2005), පුරාණ ලංකාව, එස්. ගොඩගේසහ සහෝදරයෝ, කොළඹ 10.

මහාවංශය-සිංහල. (2003), බෞද්ධසංස්කෘතිකමධ්‍යස්ථානය, දෙහිවල

Bohingamuwa, W. (2005) The Ancient Panda Wawa: Archaeological Investigation; Geographical and Historical Background, Ancient Ceylon No 18-July 2005, Department of Archaeology, Colombo 07